# මැතිවරණය නිරීක්ෂණයට 5000කට වැඩි පිරිසක්

## ● පැෆරල් සංවිධානය

**සුභාෂිණී සේනානායක**

මැතිවරණ දිනයේ සමස්ත නිරීක්ෂණ ක්‍රියාවලියට 5000කට වැඩි පිරිසක් යෙදවීමට කටයුතු කරන බව පැෆරල් සංවිධානය පවසයි.

මැතිවරණ දිනයේ ස්ථානගත කිරීමට නිරීක්ෂකයන් 3000ක් යෙදවීමට අදාළ පුහුණුවීම් මේ වන විට ආරම්භ කර ඇති බව පවසන එම සංවිධානය එම පිරිස තෝරාගත් මධ්‍යස්ථානවලට යොදවන බවද කියා සිටී.

එමෙන්ම ඡන්ද මධ්‍යස්ථානයක් අතරතුර තත්ත්වය නිරීක්ෂණය සඳහා ජංගම නිරීක්ෂණ කණ්ඩායම් 200ක් යෙදවීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා නිරීක්ෂකයන් 1000ක් යෙදවීමට කටයුතු කරන බවත් එම සංවිධානය කියා සිටී.

රට යථා තත්ත්වයට පත්වීමෙන් පසුව නිරීක්ෂණ කාර්ය ඉකුත් 15 වැනිදින ආරම්භ කළ බවත් එදින සිට ජූලි 01 වැනිදින දක්වා වාර්තා වී ඇති සමස්ත පැමිණිලි සංඛ්‍යාව 229ක් වන බවත් පවසන එම සංවිධානය මේ අතරින් සිදුවීම් 114ක් තහවුරු කරගෙන ඇති බවත් කියා සිටී.

මේ පැමිණිලි සලකා බැලීමේදී මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා 10කද, නීති විරෝධී මැතිවරණ ප්‍රචාරය සම්බන්ධ පැමිණිලි 132ක්ද, පොදු දේපළ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගැනීම් පිළිබඳව පැමිණිලි 17ක් ද, ලැබී තිබෙන අතර පැෆරල් මධ්‍යස්ථානයට ලැබී ඇති මැතිවරණ පැමිණිලි සම්බන්ධයේ අදාළ පියවර ගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත සාක්ෂි සහිතව පැෆරල් සංවිධානය විසින් පැමිණිලි යොමු කරන බවත් කියා සිටී.

මේ වන විට එවැනි ආකාරයට යොමුකර ඇති පැමිණිලි ප්‍රමාණය 182කි. ලැබී ඇති පැමිණිලි අතර වැඩිම පැමිණිලි ප්‍රමාණයක් ලැබී ඇත්තේ මහනුවර දිස්ත්‍රික්කයෙන්ය.නාම යෝජනා දින සිට කොවිඩ් කාලයේ පැමිණිලි 79ක් වාර්තා වී ඇත. මේ සිදුවීම් අතර වාර්තා වී ඇති සිදුවීම් සියල්ලටම සහනාධාර බෙදීම්වලට අදාළව වන අතර මෙහිදී රජය විශේෂ සහනාධාර වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ අතර එහි ප්‍රධානතම අංගය වූයේ රු.5000.00 දීමනාවයි. එය ආරම්භයේදී රාජ්‍ය නිලධාරීන් හරහා සිදුවූවද පසුකාලීනව දේශපාලන මැදිහත්වීම් හරහා සිදුවන බව වාර්තා විය. මෙවැනි ජාතික ව්‍යසනයකදී සහනාධාර ලබාදීම රජයක වගකීම වුවද මැතිවරණයක් ක්‍රියාත්මක මොහොතක එය සංවිධානාත්මකව දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන ආකාරයට නොවිය යුතුය. එමෙන්ම එම කාලයේ අපේක්ෂයකු බවට පත්වී සිටින පළාත් පාලන ප්‍රධානීන් ද තම ආයතනවල සම්පත් සහනාධාර ලෙස බෙදා හැරීම හරහා දේශපාලන වාසියක් අත් කරගෙන ඇති ආකාරය නිරීක්ෂණය වූ බවත් ඔවු වැඩිදුරටත් කියා සිටී.